දැයට කිරුළ

# රක්ෂණ ආවරණයක් (Insurance Cover) ලබා ගන්නේ කෙසේද?



ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය

රක්ෂණ කර්මාන්තයේ නියාමන ආයතනය

(මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මකයි)

IBSL INSURANCE BOARD OF SRI LANKA

## රක්ෂණ ආවරණයක් ලබා ගත හැකි ක්‍රම.

1. රක්ෂණ නියෝජිතයෙකු මාර්ගයෙන්
2. රක්ෂණ තැරැව්කාර සමාගමකින්
3. රක්ෂණ සමාගමකින්

ඔබ රක්ෂණ නියෝජිතයෙකු (Insurance Agent) මාර්ගයෙන් රක්ෂණ ආවරණයක් ලබා ගන්නේ නම් සැලකිලිමත් විය යුතු කරුණු.

- **රක්ෂණ නියෝජිතයකු (Insurance Agent) යනු කවුද?**

රක්ෂණ නියෝජිතයකු යනු රක්ෂණ සමාගමක් හෝ රක්ෂණ තැරැව්කාර සමාගමක් සමග නියෝජිතයකු ලෙස ලියාපදිංචි කර ඇති එසේම කොමිස් මුදලක් සැලකිල්ලට ගෙන ඒ රක්ෂණ සමාගම හෝ තැරැව්කාර සමාගම වෙනුවෙන් රක්ෂණ ව්‍යාපාර ලබාගන්නා පුද්ගලයෙකි.

- **ඕනෑම පුද්ගලයෙකුට රක්ෂණ නියෝජිතයකු විය හැකිද?**

නොහැක. රක්ෂණ නියෝජිතයෙකු ලෙස ලියාපදිංචිය සඳහා අවම වශයෙන් අ.පො.ස (සා.පෙළ) ගණිතය ඇතුළුව සමත්වී තිබිය යුතුය. එමෙන්ම, ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය* මගින් පවත්වන පූර්ව බඳවා ගැනීමේ විභාගය සමත් වී තිබිය යුතුය.

- **සුදුසුකම් ලත් නියෝජිතයෙකු යැයි ඔබ දැනගන්නේ කෙසේද?**

රක්ෂණ නියෝජිතයෙකු සමග රක්ෂණ කටයුතු කරන මහජනතාවට එම රක්ෂණ නියෝජිතයාගේ අනන්‍යතාවය පරීක්ෂා කිරීමට අයිතියක් ඇත. සෑම රක්ෂණ නියෝජිතයෙකු වෙතම රක්ෂණ සමාගම හෝ රක්ෂණ තැරැව්කාර සමාගම විසින් හැඳුනුම්පතක් නිකුත්කොට ඇත. එම හැඳුනුම්පතේ නියෝජිතයාගේ නම, ජා.හැ.අංකය, ලියාපදිංචි අංකය, සමාගමේ නම, බලයලත් නිලධාරියකුගේ අත්සන සහ නියෝජිත අංකය යනාදි තොරතුරු සඳහන් වේ.

*ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය, 1 මහල, ශාන්ත මයිකල් මාවත, කොළඹ 03. දුරකථන: 011 2451426, 011 2432050

IBSL
INSURANCE
BOARD OF SRI LANKA

දැයට කිරුළ

- ## රක්ෂණ නියෝජිතයකුගෙන් රක්ෂණ ඔප්පුවක් ලබා ගත හැකිද?

රක්ෂණ නියෝජිතයෙකුගෙන් අදාල රක්ෂණ සමාගමෙන් නිකුත් කරන ලද රක්ෂණ ඔප්පුවක් ලබාගත හැකිය. එසේ ලබා ගත් විගස එය හොඳින් කියවා බලා අපැහැදිලි කරුණු ගැන අවබෝධයක් ලබා ගන්න. රක්ෂණ නියෝජිතයකු සමග අදාල රක්ෂණ ඔප්පුව සම්බන්ධයෙන් හැර වෙනත් කිසිදු මූල්‍ය ගිවිසුමකට (පුද්ගලික මට්ටමෙන්) එලඹීමෙන් වලකින්න.

- ## ඔබ සැලකිලිමත් විය යුතු අනිකුත් කරුණු මොනවාද?

රක්ෂණ නියෝජිතයකු තෝරා ගැනීමේදී නිතරම තමන්ට විශ්වාසදායි අයෙකු තෝරාගත යුතුය. පළමුව, රක්ෂණ යෝජනා පත්‍රය නියෝජිතයකු ලවා සම්පූර්ණ කරන අවස්ථාවක එය;

- අත්සන් කිරීමට ප්‍රථම හොඳින් කියවා බලන්න. රක්ෂණ ආවරණය ලබාගැනීමේදී හිමිකම් ලැබෙන අවස්ථා මෙන්ම හිමිකම් අත්හැරීමේ, එනම්, හිමිකම් නොගෙවන අවස්ථා ද හොඳින් අවබෝධ කරගන්න.
- තමාට කියවා තේරුම් ගත හැකි භාෂාවකින් යෝජනා පත ඉල්ලා සිටින්න.
- යෝජනා පතෙහි සත්‍ය හා නිවැරදි තොරතුරු අනාවරණය කරන්න.
- වෙනත් කෙනෙකු පුරවන ලද යෝජනා පතට ඔබ අත්සන් කරන්නේ නම් එහි අඩංගු කරුණු සත්‍ය බවට තහවුරු කරගන්න.

- ## නියෝජිතයෙකුට මුදල් ගෙවිය හැකිද?

අදාල රක්ෂණ ආවරණය සඳහා නියෝජිතයාට මුදල් ගෙවිය හැකිය. එහෙත් එසේ මුදල් ගෙවන සෑම විටකම ඒ සඳහා එම රක්ෂණ සමාගම විසින් නිකුත් කරන රිසිට් පතක් අනිවාර්යෙන්ම එම අවස්ථාවේම ලබා ගන්න.

IBSL
INSURANCE
BOARD OF SRI LANKA

## පනත යටතේ රක්ෂණ කර්මාන්තයේ නියැලීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් ලියාපදිංචිකර ඇත්තේ පහත සඳහන් සමාගම් පමණි. (ඉංග්‍රීසි ආකාරාදි පිළිවෙළට දක්වා ඇත)

| | නම | වර්ගය |
|---|---|---|
| 01 | ඇලියොන්ස් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 02 | ඇලියොන්ස් ලයිෆ් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් | ජීවිත රක්ෂණය |
| 03 | අමානා තකාෆුල් පි එල් සී | ජීවිත හා සාමාන්‍ය රක්ෂණය |
| 04 | ඒෂියන් එලයන්ස් ඉන්ෂුවරන්ස් පි එල් සී | ජීවිත හා සාමාන්‍ය රක්ෂණය |
| 05 | අවිවා එන් ඩී බී ඉන්ෂුවරන්ස් පි එල් සී* | ජීවිත හා සාමාන්‍ය රක්ෂණය |
| 06 | සෙලින්කෝ ඉන්ෂුවරන්ස් පි එල් සී | ජීවිත හා සාමාන්‍ය රක්ෂණය |
| 07 | සෙලින්කෝ තකාෆුල් ලිමිටඩ්** | සාමාන්‍ය රක්ෂණය |
| 08 | චාට්ස් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්*** | සාමාන්‍ය රක්ෂණය |
| 09 | කොන්ටිනෙන්ටල් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 10 | කෝපරේට්ව් ඉන්ෂුවරන්ස් කම්පනි ලිමිටඩ් | ජීවිත හා සාමාන්‍ය රක්ෂණය |
| 11 | එච් එන් බි ඇෂුවරන්ස් පි එල් සී | ජීවිත හා සාමාන්‍ය රක්ෂණය |
| 12 | ජනශක්ති ඉන්ෂුවරන්ස් පි එල් සී | ජීවිත හා සාමාන්‍ය රක්ෂණය |
| 13 | ලයිෆ් ඉන්ෂුවරන්ස් කෝපරේෂන් (ලංකා) ලිමිටඩ් | ජීවිත රක්ෂණය |
| 14 | එල් ඕ එල් සි ඉන්ෂුවරන්ස් කම්පනි ලිමිටඩ් | ජීවිත හා සාමාන්‍ය රක්ෂණය |
| 15 | එම් බි එස් එල් ඉන්ෂුවරන්ස් කම්පනි ලිමිටඩ් | ජීවිත හා සාමාන්‍ය රක්ෂණය |
| 16 | පීපල්ස් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 17 | සීමාසහිත සණස රක්ෂණ සමාගම | ජීවිත හා සාමාන්‍ය රක්ෂණය |
| 18 | ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් | ජීවිත හා සාමාන්‍ය රක්ෂණය |
| 19 | යූනියන් ඇෂුවරන්ස් පි එල් සී | ජීවිත හා සාමාන්‍ය රක්ෂණය |

* ඊගල් ඉන්ෂුවරන්ස් පී එල් සී ලෙස කලින් හැඳින්විය.

** දැනට මෙම සමාගමේ කටයුතු මණ්ඩලයේ විමර්ශනයට ලක් වී ඇත.

*** සිංහ හෝල්ඩින්ස් ඒ අයි ජී ඉන්ෂුවරන්ස් කම්පනි ලිමිටඩ් ලෙස කලින් හැඳින්විය.


ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය
11 වන මහල, නැගෙනහිර කුළුණ
ලෝක වෙළඳ මධ්‍යස්ථානය, කොළඹ 01.
දුරකථන : 011 2396 184-9, ෆැක්ස් : 011 2396 190
ඊ-මේල් : info@ibsl.gov.lk, වෙබ් : www.ibsl.gov.lk